**පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 - 2024**
**---------------------------------------------------------------------------------------**

## 1. විගණන මතය

**1.1** පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18හි 2024 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද, ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** 2024 වර්ෂයට අදාලව පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 ට අදාලව විගණන වාර්තා නිකුත් කළ අතර, එම වාර්තාවල තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කර තිබුණි. තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කිරීම සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 17 ක ගොඩ ඉඩම් හෙක්ටයාර 9.1586 ක, පාංශු පරීක්ෂණ කට්ටල 18 ක පැරණි හා නව ගබඩා 07 ක, කාර්යාලීය ගොඩනැඟිලි 04 ක, රජයේ නිවාසයක, බීජ ගබඩාවක, මුරකුටියක, වැසිකිලි පද්ධතියක හා පටක රෝපණාගාරයක් වශයෙන් වූ මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සේවා මධ්‍යස්ථාන 02 ක ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් තක්සේරු කර ඇති අතර අනෙකුත් මධ්‍යස්ථාන වල ඉඩම් හා ගොඩනැගිලි සියල්ල ඉදිරියේදී තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා දෙකක වෙන්දේසි කර හා වෙනත් ආයතන වෙත පවරා දී ඇති රු.762,618 ක් වටිනා යන්ත්‍රෝපකරණ හා වාහන මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර නොතිබුණි. | මෙම යන්ත්‍රෝපකරණ හා වාහන වල වටිනාකම ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ප්‍රධාන කාර්යාලය වෙත යොමු කර ඇති බව. | නිසි පරිදි ගිණුම්වල ගලපා අදාළ ශේෂ ඉවත්කර නිවැරදි ශේෂ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | කාරක සභා 11 කට අදාලව ට්‍රැක්ටර් රථ, ගොයම් කපන යන්ත්‍ර, කෘෂි උපකරණ හා කොළ මඩින යන්ත්‍ර සඳහා ගෙවිය යුතු රු.9,913,774 ක් ජංගම නොවන වගකීම් | ට්‍රැක්ටර් හා කෘෂි උපකරණ ශේෂයන් සමුච්චිත අරමුදලට ගැලපීමට අනුමැතිය ලබා ගැනීමට ප්‍රධාන කාර්යාලය වෙත | විධිමත් පරීක්ෂාවක් සිදුකර වත්කම් නොතිබීමට හේතු අනාවරණය කර ගැනීම |

| | | | |
|---|---|---|---|
| | ලෙස හඳුනාගෙන තිබුණද, ඊට ආදාළ වත්කම් ආයතන සතුව නොතිබුණි. | යොමුකර ඇති බව. | හා ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල සුදුසු පරිදි ගැලපීම් කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 03ක දේශගුණ සුහුරු වාරි ව්‍යාපෘතිය යටතේ 2022 වර්ෂයේ දී ලැබී තිබුණු බීජ සිටුවීමේ යන්ත්‍ර 4 ක, ගොයම් පැළ සිටුවන යන්ත්‍ර 10 ක, ජල උස මාපක 16 ක, බිත්තර වී ඉසීමේ යන්ත්‍රයක, වල් නෙළීමේ යන්ත්‍ර 06 ක, අලිවැට උපකරණ තොගයක, මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරයක, ස්මාර්ට් රූපවාහිනී යන්ත්‍රයක, වීඩර් යන්ත්‍ර 03 ක, Tripod screed 01 ක හා ලැප්ටොප් පරිගණකයක් වශයෙන් මූල්‍ය නොවන වත්කම් අයිතම 45ක වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්ගත කිරීම සඳහා වටිනාකම් ලබා දෙන ලෙස දේශගුණ සුහුරු වාරි ව්‍යාපෘතියෙන් ඉල්ලීම් කර ඇති බව. | මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 04 ක සමාලෝචිත වර්ෂයට අදාළව ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.326,847 ක් වැඩියෙන්ද, කාරක සභා 02 ක රු.31,881 ක් අඩුවෙන්ද, මහකුඹුක්කඩවල කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට උපචිත පොලිය රු.11,200 ක් අඩුවෙන්ද, ගිණුම්ගත කර තිබුණු අතර කාරක සභා 02 ක් විසින් උපචිත පොලිය රු.207,892 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මගින් 2025 ගිණුම් වාර්තාව නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පොලී ලැබීම් නිවැරදිව ගලපා ගිණුම් නිවැරදි කළ යුතුය. |

**1.3.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සවිස්තරාත්මක සටහන්, තක්සේරු වාර්තා, ශේෂ සනාථන සහතික, ඔප්පු, ණය ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් සහතික, උපලේඛන සහ ණයහිමි කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගොවිජන සේවා කාරක සභා 17 ක එකතුව රු.67,238,041 ක වත්කම් විෂයයන් 51 ක් හා එකතුව රු.12,439,631 ක වගකීම් විෂයයන් 20 ක් විගණනයේදී සතුටු දායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | සවිස්තරාත්මක සටහන්, තක්සේරු වාර්තා ශේෂ සනාථන සහතික ණය ලේඛන, හිමිකම් සහතික ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | වත්කම් සහ වගකීම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.4 නීතී, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීතී, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| | 53(4) වගන්තිය | සෑම වසර 03 කට වරක්ම කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන ප්‍රතිශෝධනය කළ යුතු වුවත්, කාරක සභා 12 ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝග අනුව සිදු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |
| | මුදල් රෙගුලාසි 128(1), 315, 880 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 09 වගන්තිය | මුදල් හෝ තොග සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලයදී ඇති සියලුම නිලධාරීන් ඇප තැබිය යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 17 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඇප තබා නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 7/2/15/3/3(VII)තාව හා 2023 ජනවාරි 23 දිනැති ලිපියට අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇප තැබීම කළ යුතුය. |
| **(ඇ)** | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ | | | |
| (i) | 1994 මාර්තු 16 දිනැති අංක 392/94 දරන චක්‍රලේඛය | වෙනත් ආයතනවලින් හෝ පුද්ගලයින්ගෙන් අයවිය යුතු මුදල් නොපමාව අයකර ගතයුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 15 ක වසර කිහිපයක සිට පැවත එන රු.64,867,736 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දීර්සකාලීන ශේෂ සමහරක් අය කර ගෙන ඇති අතර නිරවුල් නොවූ ශේෂ අයවූ වහාම නිරවුල් කිරීමට කටයුතු කරන බව. | කාලීනව ණය අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර හිඟ ශේෂ අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය |
| (ii) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන චක්‍රලේඛයේ 5.6(**i**) ඡේදය | ගොවිජන බැංකුව ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් බැවින් ගොවිජන බැංකුවට අදාළ සියළුම | ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලද වහාම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගිණුම් ගොවිජන කාරක සභාවේ වාර්ෂික අවසන් ගිණුම්වලට ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 18ම එසේ කටයුතු කර නොතිබුණි. | කටයුතු කරන බව. | |
| (iii) | 2018 අප්‍රේල් 20 දිනැති අංක 06/2018 දරන චක්‍ර ලේඛය | චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පරිදි පුරන් කුඹුරු පිළිබඳ තොරතුරු පිළියෙල කර පවත්වාගෙන යා යුතු අතර C කාණ්ඩයේ පුරන් කුඹුරු සම්බන්ධයෙන් චක්‍රලේඛයේ ඇමුණුම 02 හා ඇමුණුම 03 ආකෘතිය පිළියෙල කර දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වෙත 2018 මැයි 31 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් 2025 ජනවාරි 30 දින වන විට වර්ෂ 06 ක් ගතවී තිබුණද කාරක සභා 12 ක් එපරිදි කටයුතු කර නොතිබුණි. | මේවන විට අදාළ ආකෘති කාරක සභා වලින් පිළියෙළ කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2024 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 හි එකතුව රු.24,013,111 ක අතිරික්තයක්ද, ගොවිජන බැංකු 18 හි එකතුව රු.15,512,473 ක අතිරික්තයක්ද වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 හි එකතුව රු.21,483,706 ක ශුද්ධ අතිරික්තයක්ද ගොවිජන බැංකු 18 හි එකතුව රු.13,505,619 ක අතිරික්තයක්ද විය.

### 2.2 විශ්ලේෂණාත්මක සමාලෝචනය

(අ) පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, බීජ හා පැල, කෘෂි උපකරණ ඇතුළු කෘෂිකාර්මික භාණ්ඩ අලෙවි කිරීමට අදාළ සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 හි මුළු අලෙවි ආදායම් එකතුව රු.193,624,569 ක් ද මුළු දළ ලාභයේ එකතුව රු.10,783,920 ක් ද විය. ඒ අනුව ගොවිජන සේවා කාරක සභා 18 හි සමස්ථ දළ ලාභ අනුපාතය සියයට 5.6 ක් වී තිබුණි. ඊට අනුරූපීව පෙර වර්ෂයේ එය සියයට 8 ක් වුයෙන් දළ ලාභ අනුපාතයේ අඩුවීම සියයට 2.4කි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජකදළුව ගොවිජන සේවා කාරක සභාවේ එකතුව රු.196,684 ක ශේෂයක් සහිත ඉතිරි කිරීමේ ගිණුම් 02 ක් සහ කාරක සභා 06 ක එකතුව රු.385,241ක ශේෂයක් සහිත ජංගම ගිණුම් 07 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට අක්‍රියව පවතින අතර එම මුදල් ඵලදායි ලෙස උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මේවන විට භාවිතා නොකරන ගිණුම් වසා දමා එම ශේෂයන් ඉතිරි කිරීමේ ගිණුමට මාරු කිරීමට කටයුතු කර ඇති බව හා හාල්දඩුවන කාරක සභාවේ අක්‍රියව පවතින ගිණුම ස්ථාවර තැන්පත් ගිණුමකට මාරු කිරීමට කටයුතු කරන බව. | අරමුදල් වඩාත් ඵලදායි ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 18 විසින් පරිගණක මෘදුකාංග වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.308,358 ක් සහ ගොවිජන බැංකු නිලධාරීන් පුහුණු කිරීම වෙනුවෙන් රු.183,042 ක් ඉකුත් වර්ෂයේදී ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයට ගෙවා තිබුණද, එම ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය විසින් සිදුකළ යුතු බව. | නොපමාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුන්නේෂ්වරම ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් වසම් 12 ක සිදුකල නියැදි පරීක්ෂාවේ දී, කීර වගාව සඳහා අක්කර 102.75 ක් ද, පොල් වගාව සඳහා අක්කර 22.75 ක් ද වශයෙන් කුඹුරු ඉඩම් අක්කර 125.5 ක් වී වගාව හැර වෙනත් වගාවන් සඳහා භාවිතා කර තිබුණු අතර අක්කර 37.4 ක කුඹුරු ඉඩම් ගොඩ කර තිබුණි. එහෙත් 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 30 (2), (3), 32(1) සහ 33(1) උප වගන්තීන් ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරය ලබාගෙන නොතිබුණි. | ගොවිජන සංවර්ධන පනතේ 30 වගන්තිය යටතේ අදාළ පුද්ගලයින් හදුනා ගෙන නිත්‍යානුකූලව අවසර ලබා දීමට කටයුතු කරන බව. | වී වගා කිරීමට නොහැකි කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් පනතේ වගන්ති හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, විධිමත් පරීක්ෂණයක් පවත්වා ඊට අනුකූල නොවූ නිලධාරීන්ට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුන්නේශ්වරම වසමේ ගොවි මහතෙකු සතු වසර 20 ක් පමණ වගා නොකරන ලද අක්කර 01, රූඩ් 03, පර්චස් 264ක ඉඩම කුඹුරු ඉඩම් ලේඛනයෙන් ඉවත් කිරීමට කරන ලද ඉල්ලීම් අනුව පරික්ෂා කිරීමේදී වී වගා කළහැකි ඉඩමක් බව අනාවරණය වීම නිසා ගොවිජන සංවර්ධන පනතේ 23(1) වගන්තියට අනුව සුපරීක්ෂණ නියමයන් නිකුත් කලද එම සුපරීක්ෂණ නියමයන් ද නොසළකා කටයුතු කර තිබුණ අතර එහෙත් 2018 අගෝස්තු 01 දිනැති අංක 17/2018 දරන චක්‍රලේඛය හා පනතේ වගන්ති ප්‍රකාරව එම ඉඩම් කොටස පවරාගෙන වගා කිරීමට ගොවිජන සංවර්ධන කාරක සභාව හා දිස්ත්‍රික් කාර්යාලය කටයුතු කර නොතිබුණි. | මේවන විට සුපරීක්ෂණ කමිටු පිහිටුවා අකාර්යක්ෂම ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කරන බව. | වී වගා කළහැකි කුඹුරු ඉඩම්වල වී වගා නොකිරීම සම්බන්ධව චක්‍රලේඛ හා පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | අක්කර 160 ක් පමණ තිබුණු කෝට්ටපිටිය වැවේ භූමි ප්‍රමාණය අනවසර ඉදිකිරීම් හේතුවෙන් අක්කර 25 කින් පමණ අඩුවී ඇති අතර එම භූමියේ සිදුවන අනවසර ක්‍රියාවන් හේතුවෙන් වැවට විවිධ හානි සිදුවී තිබුණි. එසේ වුවද, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 96 වගන්තිය ප්‍රකාරව එම පුද්ගලයන් වෙනුවෙන් අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම අනවසරකරුවන් ඉවත් කිරීම තුල සංකීර්ණ මෙන්ම ගැටළුකාරී තත්වයන් නිරීක්ෂණය වන බැවින් මෙම විෂයයට සම්බන්ධ රාජ්‍ය ආයතන වල එකඟතාවයෙන් ඒකාබද්ධ පරීක්ෂණයක් සිදුකර තීරණ ගැනීම සුදුසු බව දන්වා ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | අනවසර අල්ලා ගැනීම් සම්බන්ධව පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2 KR – 2006, 2008, 2010 ව්‍යාපෘතිය යටතේ රු.250,000 බැගින් අත්ට්‍රැක්ටර් 93 ක් ද රු.200,000 බැගින් අත්ට්‍රැක්ටර් 25 ක් ද වශයෙන් අත්ට්‍රැක්ටර් 118 ක් ගොවි මහතුන් 118 දෙනෙකු වෙත ණය පදනම මත ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවි මහතුන් 41 ක් දෙනෙකුගෙන් රු.5,494,420 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව තිබුණි. තවද අලුත්වැඩියා කිරීම සඳහා අමතර කොටස් වෙළඳපොලෙහි නොතිබීම මත ට්‍රැක්ටර් බොහොමයක් වර්තමානය වන විට නිශ්කාර්යව පැවතුණි. | ට්‍රැක්ටර් හිඟ වාරික අයකර ගැනීම සඳහා ඉදිරි මාස 03 ඇතුළත වැඩසටහන් ක්‍රියාත්මක කරන බව හා අමතර කොටස් මිළදී ගැනීම සම්බන්ධව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | කාලීනව හිඟ ණය අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, හිඟ ණය අයකර ගැනීමටත්, අලුත්වැඩියාව සඳහා අමතර කොටස් ගෙන්වා දීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර අනුව කෘෂිකාර්මික ඉඩම් වල තිරසර සංවර්ධනය හා සියළු කෘෂිකාර්මික ඉඩම් වලින් ප්‍රශස්ථ ඵලදායීතාවයක් ලබා ගැනීමට ඉලක්ක ගත වී තිබුණද, පුත්තලම දිස්ත්‍රික්කයේ වසම් 303 ක අස්වනු ඵලදාව සලකා බැලීමේදී 2023 යල කන්නයේ, 2023/2024 මහ කන්නයේ සහ 2024 යල කන්නයේ, අසාමාන්‍ය ඵලදායීතා විචලනයක් පැවතුණි. එසේ වුවද, ඒ ඒ කෘෂිකාර්මික ඉඩම්වල කාලීන ඵලදායීතා විචලනයන්ට අදාළ පාලනය කළ හැකි/ නොහැකි ලෙස හේතු විශ්ලේෂණය කර විසඳුම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික උපදෙස් ලබා ගෙන අස්වැන්න වැඩිකර ගැනීම සඳහා ගොවීන්ට අවශ්‍ය පහසුකම්, දැනුම ලබා දීමට කටයුතු කර ඇති බව. | ඵලදායීතා විචලනයට හේතු සොයා බලා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 18 කට අයත් වසම් 340 ක පවතින කුඹුරු අක්කර 59,468 ක භූමි ප්‍රමාණයෙන් 2023 යල, 2023/24 මහ සහ 2024 යල කන්නවල පිළිවෙලින් අක්කර 13,238 ක්, 14,755 ක් සහ 17,886 ක් වගා කටයුතු සිදු නොකර පැවතීම මත කන්න තුනෙහිම අස්වැන්න (අක්කර 01 ක සාමාන්‍ය අස්වැන්න වී බුසල් 80) වී බුසල් මිලියන 3.67 ප්‍රමාණයක් දළ දේශීය නිෂ්පාදිතයට අහිමි වී තිබුණි. | අදාළ කන්නයන් සඳහා වගා ඉලක්කයන් ලබා දී ඇති අතර ඔබ විසින් සඳහන් කර ඇති අක්කර ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් වගා කර ඇති බවත් වගා හානි හේතුවෙන් අදාළ ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි අතර ස්වභාවික ආපදා හැර අනෙකුත් ආපදාවන් වලක්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වගා නොකල සියලු ඉඩම් වගා කිරීමට ක්‍රමෝපායන් යෙදිය යුතුය. |
| (ඇ) | 2024/25 මහ කන්නයේ ගොවිජන සංවර්ධන කාරක සභා 15 කට අයත් වගාකල භූමි අක්කර 43,106 න් අක්කර 42,909 ක් සාමාන්‍ය මඩ වී වගාව සිදුකර තිබුණු අතර පැරශූට් ක්‍රමය හෝ පැළ සිටුවීමේ යන්ත්‍රය භාවිතා නොකිරීම හා ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් අක්කර 42,909 කින් ලබාගත හැකිව තිබූ බුසල් 36 බැගින් වූ අතිරේක අස්වැන්න බුසල් 1,544,724 ක් වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදනයට අහිමි වී තිබුණි. | ගොවීන්ට මෙම වගාවන් සියළුම කුඹුරු ඉඩම්වල සිදු කළ නොහැකි බව හා සිදු කළ හැකි කුඹුරු ඉඩම් සඳහා ගොවීන් යොමු වී ඇති බව. | අස්වනු වැඩිකර ගැනීමට පැරශූට් ක්‍රමය හෝ පැළ සිටුවීමේ යන්ත්‍රය ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 හි 2024 යල කන්නයේ වගා කටයුතු 2024 මාර්තු මස ආරම්භ කර තිබුණ ද කන්නයට අදාළව රු.මිලියන 222 ක වටිනාකමකින් යුත් පොහොර සහනාධාර මුදල් ගොවීන් 22,357 දෙනෙකුගේ බැංකු ගිණුම්වලට 2024 මැයි 20 දින සිට ගිණුම්ගත කර තිබුණි. 2024/2025 මහ කන්නයේ වගා කටයුතු 2024 සැප්තැම්බර් මස ආරම්භ කර තිබුණු අතර කන්නයට අදාලව රු.මිලියන 433 ක වටිනාකමකින් යුත් පොහොර සහනාධාර මුදල් ගොවීන් 28,955 දෙනෙකුගේ බැංකු ගිණුම්වලට 2024 ඔක්තෝබර් 28 දින සිට ගිණුම්ගත කර තිබුණි. කුඹුරු සඳහා අවශ්‍ය යූරියා සහ MOP පොහොර සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 සැප්තැම්බර් 11 දිනැති අංක PG/12/1/19/Fert දරන පොහොර නිර්දේශයට අනුකූලව යූරියා පොහොර, වී වගාකර සති 02, 04, 06 සහ 07 කාලයේදීත් MOP පොහොර, වී වගා කර සති 04 හා 06 ක කාලය තුළ යෙදිය යුතු වුවත්, පොහොර සහනාධාර මුදල් ප්‍රමාද වී ලබාදීම මත කාලීනව සහනාධාර පොහොර ගොවීන් වෙත ලැබී නොතිබුණ බව නිරීක්ෂණය විය. | ගොවීන් වෙත පොහොර සඳහා මුදල් ලබා දීම ඩිජිටල් ක්‍රමය මගින් සිදු කරන අතර නියමිත දිනට සහනාධාර පොහොර මුදල් ලබා දීමට දත්ත agrarian.lk වෙත ඇතුළත් කරනු ලබයි. කුඹුරු ජලයෙන් යටවීම, කුඹුරු ඉඩම් වල පිහිටීම අනුව ජලය ලබා ගැනීම හා ජලය බැස්සවීමේ අපහසුතා වැනි හේතු නිසා කල් පසු වී වගා කටයුතු කරන ගොවීන්ගේ දත්ත අදාළ තොරතුරු පද්ධතියට ප්‍රමාද වී ඇතුළත් වන හෙයින් ඔවුන්ට මුදල් ලබා දීමේදී යම් ප්‍රමාදයක් සිදු වන බව. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැකි ආකාරයට පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 16 ක් තුළ වැව් 1,049 ක්, අමුණු 198 ක්, ඇළ මාර්ග 247 ක්, කෘෂි මාර්ග 573 ක් සහ වගා ළිං 838 ක් පවතින අතර 2024 වර්ෂය තුළදී ඉන් වැව් 221 ක්, අමුණු 54 ක්, කෘෂි මාර්ග 144 ක් ඇළ මාර්ග 70 ක් සහ වගා ළිං 20 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සංවර්ධන යෝජනා ඉදිරිපත් කර තිබුණද, වර්ෂය තුළ ඉන් වැව් 34 ක්, අමුණු 09 ක්, ඇළ මාර්ග 02ක් සහ කෘෂි මාර්ග 08 ක ප්‍රතිසංස්කරණ කටයුතු ඉටු වී තිබුණි. | ප්‍රතිසංස්කරණය කළ යුතු වාරිකර්මාන්ත යෝජනා ඉදිරිපත් කළද වෙන්වන මුදල් ප්‍රතිපාදන මත ප්‍රතිසංස්කරණ කටයුතු සීමා වන බව. | විධිමත් පරිදි කටයුතු කර අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන සිදුකළ යුතු ප්‍රතිසංස්කරණ නොපමාව ඉටුකළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයිතිය පවරා ඇති පාලකුඩාව ගොවිජන සේවා කාරක සභා ඉඩම තුළ අඩි 12 x 14 ප්‍රමාණයක විද්‍යුත් දත්ත සන්නිවේදන සමාගමක, සම්ප්‍රේෂණ බෙදා හැරීමේ උපාංග ඉදි කර තිබුණද ඒ වෙනුවෙන් කිසිදු ගාස්තුවක් ගොවිජන සේවා කාරක සභාවට ලබා ගෙන නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරන අවස්ථාවේදීත් මෙම සම්ප්‍රේෂණ කුළුණ එම භූමියේ පිහිටා තිබූ හෙයින් ඒ සඳහා ගාස්තුවක් අය කිරීම අපහසු බව. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා සම්බන්ධිත අනෙකුත් ආයතන දැනුවත් කර විධිමත් පරිදි අදාළ සමාගමෙන් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වනාතවිල්ලුව ගොවිජන සේවා බල ප්‍රදේශයේ 635/1 අලුත් එළුවන්කුලම ග්‍රාම නිලධාරී වසමට අයත් අක්කර 39.59 ක් වන පුරන් කුඹුරු යාය ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ (හලාවත) අංක ගො/සං/දි/කා/හලා/නීති/02/01/17 දරන 2020 පෙබරවාරි 29 දිනැති ලිපිය අනුව වී වගා කළ හැකි බව නිෂ්චිතව තහවුරු වී තිබියදී 2020 දෙසැම්බර් 02 දිනැති අංක DAD/CG/01/01 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ ලිපිය අනුව වී වගා කළ නොහැකි බවට ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ පුද්ගලික නිරීක්ෂණය මත පදනම්ව වන වගාවකට දීමට එකඟතාවය ලබාදී තිබුණි. ඒ අනුව තාක්ෂණික පරීක්ෂාවකින් හෝ ඉඩමේ වගා ඉතිහාසය අධ්‍යයනය නොකර, ගොවි සංවිධාන හා අනෙකුත් ආසන්න සබඳතාවයන් ඇති පාර්ශවයන්ගෙන් ලිඛිත තහවුරුද නොගෙන විනිවිදභාවයෙන් තොරව මෙම ඉඩම පුද්ගලික සමාගමකට වන වගාව සඳහා ලබාදී තිබුණි. | ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ DAD/CG/01/01 හා 2020 දෙසැම්බර් 02 දිනැති ලිපියට අනුව කටයුතු කර ඇති බව. | තාක්ෂණික පරීක්ෂාවක් හා ඉඩමේ වගා ඉතිහාසය අධ්‍යයනය කර වී වගා කිරීමට සුදුසුද, නුසුදුසුද යන්න තහවුරු කර ගත යුතු අතර, මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කර අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 18 හි ම පාංශු පරීක්ෂණ උපකරණ, පාලකුඩාව කාරක සභාවේ ඇඹිලි සලකුණු යන්ත්‍රය, කාරක සභා 03 ක ට්‍රැක්ටර් රථ 03 ක්, රාජකදළුව කාරක සභාවේ බවුසරයක් හා බොජුන් | අදාළ වත්කම් ඉදිරියේදී ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව. | විධිමත් වැඩපිළිවෙලක් යොදා වත්කම් ඵලදායිව උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හලෙහි අලෙවි කුටි 04 ක්, මදුරන්කුලිය හා පුත්/ තබ්බෝව කාරක සභා දෙකෙහි රජයේ නිවාස 02 ක්, වනාතවිල්ලුව කාරක සභාවේ බීජ ගබඩාවක්, කාරක සභා දෙකක ගබඩා 05 ක්, හාල්දඬුවන කාරක සභාවේ ගොයම් කපන යන්ත්‍රයක් හා විසිරි ජල ව්‍යාපෘති උපකරණ නිශ්කාර්යව පැවතුණි. | | |
| (ආ) | 2012 වර්ෂයේදී වර්ල්ඩ් විෂන් ආයතනයේ මැදිහත්වීමෙන් වනාතවිල්ලුව ගොවිජන සේවා කාරක සභාවේ ඉදි කරන ලද පටක රෝපණාගාරය ඌන උපයෝජිතව පවත්වා ගෙන යනු ලබන අතර 2012 වර්ෂයේ සිට මේ දක්වා එහි ආදායම වියදම හා සැසඳීමේදී. රු.1,14 6,209 ක මූල්‍ය ප්‍රතිඵලයේ සමුච්චිත පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. | අදාළ ගොඩනැගිල්ල සහ එහි උපකරණ බදු පදනම මත ගැනුම්කරුවෙකුට ලබා දීමට කාරක සභාව විසින් අනුමැතිය ලබා දී ඇති බව. | - එම - |

**4. ගොවිජන බැංකු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකුව පිහිටුවීමේ සිට මේ දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස පවතින අතර ඒ වෙනුවට ජාතික වශයෙන් පිළිගත් බැංකුවක් ලෙස නියාමනය වන ආකාරයට පාලනයට අවශ්‍ය ඉල්ලීම් ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින් දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කාර්යාලයට යොමු කර නොතිබුණි. | ජාතික විධායක කමිටු රැස්වීමේදී මේ පිළිබඳ සාකච්ඡා කර ඇති අතර මේ සම්බන්ධ අවසන් තීරණය ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් ගත යුතු බව. | පිළිගත් බැංකුවක් ලෙස නියාමනය සිදු කර ගැනීමට අවශ්‍ය ඉල්ලීම් කළ යුතුය. |
| (ආ) | 2020 ඔක්තෝබර් 08 දිනැති අංක 9/2020 දරන ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.6.1 ඡේදය අනුව, සෑම ලියාපදිංචි ගොවි සංවිධානයක් විසින්ම ගොවි සංවිධානයේ ඉතිරි කිරීමේ ගිණුම ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියේ විවෘත කර පවත්වාගෙන යාම හා ගොවි සංවිධානයේ සියළුම ගනුදෙනු එම ඉතිරිකිරීමේ ගිණුම හරහා සිදුකල යුතු වුවත් කාරක සභා 18 ක ලියාපදිංචි ගොවි සංවිධාන 662 කින් ගොවි සංවිධාන 512 ක් විසින් වෙනත් බැංකුවල | සෑම මසකම ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර ගොවි සංවිධානවල බැංකු ගිණුම් ගොවිජන කාරක සභා බැංකුවේ පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.87,189,977ක මුදල් තැන්පත් කර තිබුණි. | | |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 18 හි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවීන් 1515 දෙනෙකුට ලබා දී තිබුණු කෘෂි ණය, ව්‍යාපෘති ණය, ව්‍යවසාය ණය සහ වෙනත් ණය එකතුව රු67,944,787කින් ගොවීන් 882 කගේ රු.29,222,898 ක හිඟ ණය ශේෂයක් අවුරුදු 01 සිට අවුරුදු 20 ට වැඩි කාලයක් කල් පසු වී ඇතත් අයකර ගෙන නොතිබුණි. | සෑම මසකම ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | හිඟ ණය ශේෂයන්ට අදාළ ණය ලබා දීම හා කාලීනව අය නොකිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අදාළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, හිඟ ණය ශේෂ අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඈ) | පුත්තලම දිස්ත්‍රික් ගොවිජන සේවා මධ්‍යස්ථාන 18 ට අදාළව වසම් 370 ක ගොවීන් 68,468 දෙනෙකු අතුරින් 2022, 2023 සහ 2024 වර්ෂයන්වල වගා ණය, ව්‍යාපෘති ණය, ව්‍යවසායක ණය සහ වෙනත් ණය ලබා දුන් ගොවීන් ගණන පිළිවෙලින් 4,111 ක්, 1,373 ක්, 806 ක් හා 333 ක් වූ අතර එය මුළු ගොවීන්ගෙන් පිළිවෙලින් සියයට 6 ක්, 2 ක්, 1.2 ක් හා 0.5 ක් තරම් ඉතා අඩු අගයක් විය. | සෑම මසකම ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | ගොවි බැංකු පිහිටුවීමේ අරමුණ අනුව ණය නිකුත් කිරීමේ ප්‍රගතිය ඉහල නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |